*සැ. යු.*– 2007.02.15 දින පළවූ අංක 1,485 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) සහ II කොටස පළනොකරන ලදී.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2001 වර්ෂයට මුද්‍රිත පොත් නාමාවලියේ අප්‍රේල්-ජූනි කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,486 — 2007 පෙබරවාරි 23 වැනි සිකුරාදා — 2007.02.23**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 134 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 138 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මාර්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2**. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3**. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5**. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතිරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**6**. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවිම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු (පිරිමි සහ කාන්තා)

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ පිරිමි සහ කාන්තා උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරි තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන ශිෂ්‍යභට නිළධාරීන්ට ආරක්ෂක අධ්‍යයන උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්ව විද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් කලා, වාණිජ සහ කළමනාකරණ හා කාර්මික විද්‍යා, පාඨමාලා කාලසීමාව අවුරුදු තුනක් වන අතර, ඉංජිනේරු පාඨමාලාව අවුරුදු තුනහමාරකි.

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍යභට නිළධාරීන් හා නිළධාරිනියන් ත්‍රිවිධ හමුදාවේ එක් එක් හමුදාව සඳහා අනුයුක්ත කිරීම එම එක් එක් හමුදාවේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව ද පදනම් කොට ගෙන සිදුකරනු ඇත. උපාධි පාඨමාලාවේ පළමු වර්ෂ දෙක සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ශිෂ්‍යභට නිළධාරීන්/නිළධාරිනීන් ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේනාංක වල අධිකාරිලත් තනතුරුවලට පත් කරනු ලැබේ.

3.2 අවුරුදු තුනක/අවුරුදු තුනහමාරක අධ්‍යයන සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුනට අදාළ පරිදි ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු උපාධිය, විද්‍යාවේදී (බී.එස්.සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය, ශාස්ත්‍රවේදී (බී.ඒ.) උපාධිය හෝ වාණිජවේදී (බී.කොම්.) උපාධිය පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්ෂකයන් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි ආරක්ෂක විද්‍යා උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

I. පහත දැක්වෙන ක්ෂේත්‍රවලින් එකක් පිළිබඳ විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු උපාධිය (පාඨමාලා කාලසීමාව අවුරුදු තුනහමාරකි).

(අ.) සිවිල් ඉංජිනේරු විද්‍යාව
(ආ.) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව
(ඇ.) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව
(ඈ.) නාවුක ඉංජිනේරු විද්‍යාව
(ඉ.) ගුවන් යානා ඉංජිනේරු විද්‍යාව

අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණයේදී භෞතික විද්‍යාව විෂයධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟා වූවන් සඳහා.

* පිරිමි අයදුම්කරුවන්ට පමණක් ඉල්ලුම් කළ හැක.

II. විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව. (කාලසීමාව අවුරුදු තුනකි.)

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා භෞතික විද්‍යා විෂයධාරාව හෝ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟා වූවන් සඳහා. (ජීව විද්‍යා විෂයධාරාව හදාරා ඇති අපේක්ෂකයින් අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් ලෙස හදාරා සිටිය යුතුය.)

* පිරිමි සහ කාන්තා දෙපක්ෂයටම ඉල්ලුම් කල හැක.

III වාණිජවේදී (බී. කොම්.) උපාධි පාඨමාලාව (කාලසීමාව අවුරුදු තුනකි).
අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා වාණිජ විද්‍යා විෂයධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධක මට්ටමට ළඟා වූවන් සඳහා.

* පිරිමි සහ කාන්තා දෙපක්ෂයටම ඉල්ලුම කළ හැක.

IV. ශාස්ත්‍රවේදී (බී. ඒ.) උපාධි පාඨමාලාව - (කාලසීමාව අවුරුදු තුනකි).
අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය, දේශපාලන විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව (විෂය අංක 73), හා ගණිතය (විෂය අංක 07) යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් සහිතව කලා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ළඟා වූවන් සඳහා.

* පිරිමි සහ කාන්තා දෙපක්ෂයටම ඉල්ලුම කළ හැක.

3.5 යම්කිසි උපාධි පාඨමාලාවකට තෝරාගනු ලබන ශිෂ්‍යභට නිළධාරියකු/නිළධාරිනියකු එම පාඨමාලාවට අයිති පොදු විෂයයන්ට අමතරව ඉංග්‍රීසි, කළමනාකරණ නීතිය, අන්තර්ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන් ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩව පුහුණුවීම්වල යෙදිය යුතුය.

04. *ශිෂ්‍යභට නිළධාරී/නිළධාරිනී තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම්* :(අවශ්‍ය සියළු සුදුසුකම් 2007 මාර්තු 23 වන දිනට සපුරා තිබිය යුතුය.)

*අයදුම්කරුවන්. :*

*(අ)* ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

*(ආ)* 2007 මාර්තු මස 23 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩිවිය යුතුයි.

*අධ්‍යාපන සුදුසුකම් :*

*(ඇ.)* විභාග කොමසාරිස් ජෙනරාල් විසින් විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට සහතික කොට ඇති පහත සඳහන් සුදුසුකම් සපුරාලු අය හට ඉල්ලුම් කළ හැක.

I අ.පො.ස. (උසස් පෙළ) විභාගයට නව නිර්දේශ යටතේ පෙනී සිට

*(අ)* අනුමත විෂයයන් තුනටම (03) අවම වශයෙන් සාමාන්‍ය (එස්) සාමාර්ථ ලබා තිබිය යුතුය.

*(ආ)* පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයෙන් ද, විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා සමත්ව සිටිය යුතුය.

(විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට විභාග කොමසාරිස් ජෙනරාල්/විදුහල්පති විසින් නිකුත් කල ප්‍රතිඵල ලේඛණයක ඡායා පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

II අවම වශයෙන් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (සී) සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

*(ඈ.)* පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතුය.

| | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|
| *උස* : | යුද හමුදාව සඳහා - සෙ. මී. 165.1 (5′ 5″) | සෙ. මී. 153 (5′) |
| | නාවික හමුදාව සඳහා - සෙ. මී. 168.3 (5′ 6″) | |
| | ගුවන් හමුදාව සඳහා - සෙ. මී. 168.3 (5′ 6″) | |

*බර*: කිලෝ ග්‍රෑම් 50 (රා. 110)

*පපුව*: සෙ. මී. 81.25 (32″) (ප්‍රශ්වාස)

*සටහන* :- ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන්හි විශේෂ කෞශල්‍යයක් දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

*(ඉ)* මනා සෞඛ්‍ය තත්වයක සිටිය යුතුවේ. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුතුය.

*(ඊ)* අවිවාහකයෙකු විය යුතු වේ. (උපාධි අපේක්ෂක ශිෂ්‍ය භටයෙකුට හෝ නිළධාරියකුට/නිළධාරිනියකුට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

5. **සේවා කොන්දේසි** - තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යභට නිළධාරීන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව පනවන ලද්දාවූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත.

6. බඳවා ගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අවම වශයෙන් අවුරුදු 10 හෝ 12 ක කාලසීමාවක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින්ට ශිෂ්‍යභට නිළධාරියෙකුට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක ශිෂ්‍යභට නිළධාරියෙකුගේ වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 1,78,440 ක් වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද සැලැස්වේ.

(i) නොමිළයේ ආහාර හා නවාතැන් ;
(ii) නොමිළයේ නිළ ඇඳුම් ;
(iii) අනුගාමික සේවාවන් ;
(iv) ක්‍රීඩා හා විනෝද පහසුකම් ;
(v) නොමිලයේ වෛද්‍ය පහසුකම්.

8. ශ්‍රී ලංකා යුද හමුදාව, නාවුක හමුදාව හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවි වලට අදාළ වන පරිදි අදාළ සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා වලට හිමිකම් ලබනු ඇත.

*(අ)* ලුතිනන් කර්නල්/කොමාන්ඩර්/විංග් කොමාන්ඩර් නිලය දක්වා නිළධාරීන්ට දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණ පහත දැක්වේ.
2/ලුතිනන්/වැඩ බලන උප ලුතිනන්/නියමු නිළධාරි-වර්ෂයකට රු. 1,89,240/-

ලුතිනන්/උප ලුතිනන්/පියාසර නිළධාරි
වර්ෂයකට රු. 275,220-30x7740-507,420/-

කපිතන්/ලුතිනන්/පියසර ලුතිනන්
වර්ෂයකට රු. 3,21,660 -24x7740 - 5,07,420/- -

මේජර්/ලුතිනන් කොමාන්ඩර්/බලසෙණාධිපති
වර්ෂයකට රු. 352,620-20x7740-රු. 5,07,420/-

ලුතිනන් කර්නල්/කොමාන්ඩර්/විංග් කොමාන්ඩර්
වර්ෂයකට රු. 3,62,100 - 15x9,480 - 5,04,300/-

*(ආ)* පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

(i) සුදුසුකම් දීමනා

(ii) නොමිලයේ ආහාර හෝ ආහාර දීමනාව

(iii) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිළධාරීන්ට පමණක්)

(iv) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්

*(ඇ)* පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

(i) ඇතුලත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්

(ii) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී

(iii) නොමිලයේ නිළ ඇඳුම්

(iv) විවාහක නිළධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිළධාරීන්ට අනුගාමික සේවය

(v) ඇතුලත විසීමට නියෝග ලැබ සිටින නිළධාරීන්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්

9. ශ්‍රී ලංකා යුද, නාවුක සහ ගුවන් හමුදා නිළධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

*(අ.)* යුද හමුදා/නාවුක හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය

*(ආ.)* යුද හමුදා / නාවුක හමුදා/ ගුවන් හමුදා නිළධාරීන් උදෙසා ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන වලංගු රෙගුලාසි

*(ඇ.)* ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පලකරන වලංගු යුද හමුදා/නාවුක හමුදා/ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ සේනාවිධායක සහ /හෝ අදාළ හමුදාපතින් විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැක.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක ශිෂ්‍යභටයින් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13. *භාෂා අවශ්‍යතා* :- තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේ දී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතින්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.* - අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. *අයදුම්පත්* :- උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තුවන්නන් විසින් දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව තමන් විසින්ම පිළියෙල කරගත් අයදුම්පත් එවිය හැකිය. *නැතහොත්* තම ලිපිනය ලියූ රු. 5 ක් (රුපියල් පහක්) වටිනා මුද්දර අලවන ලද (9"x4" ප්‍රමාණයේ) ලියුම් කවරයක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ "ලේඛකාධිකාරී" වෙත එවීමෙන් අදාළ අයදුම් පත්‍රය හා වැඩි දුර විස්තර අඩංගු පත්‍රිකාව ලබාගෙන අයදුම් කළ හැකිය.

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේ දී දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල් සියයක (රු. 100) මුදලක් "සේනාවිධායක, කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය" නමින් ලංකා බැංකුවේ "මොරටුව-ඉඩම" ශාඛාවේ අංක "681950" ගිණුමට බැරකර, **ඔබවෙත ලැබෙන ලදුපත - අයදුම්පත සමග අමුණා එවිය යුතුය**. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසි වලට අනුකූල නොවන හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත එවීමේ දී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. තව ද අයදුම්පත සමග රු. 5 ක් (රුපියල් පහක්) වටිනා මුද්දර ඇලවූ, තම ලිපිනය ලියූ (9"x4" ප්‍රමාණයේ) ලියුම් කවරයක් එවිය යුතුය.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ක්‍රි. ව. 2007 මාර්තු මස 23 වෙනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ "ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය, කඳවලවත්ත, රත්මලාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ශිෂ්‍යභට තනතුර සඳහා අයදුම්පත" යනුවනේ සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූළ නොවන්නා වූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිළධාරින්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බවට එම ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

19. උප්පැන්න සහතිකය සහ අධ්‍යාපන සහතික වල ඡායා පිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ පාලක මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටීම අවශ්‍ය වන්නේ ය.

21. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරන්නට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විද්‍යාපීඨය මගින් ගෙවනු නොලැබේ.

22. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

23. අයදුම්පත් ලද බැව් දන්වනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ
අමාත්‍යාංශයේ ලේකම් සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන්
කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ පාලක මණ්ඩලයේ
සභාපති.

## ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය

*උපාධි අපේක්ෂක ශිෂ්‍යභට තනතුරු සඳහා අයදුම්පත්‍රය*

| ජාතික හැඳුනුම්පත් අංකය |
|---|
| |

01. *අ.* සම්පූර්ණ නම :————.

*ආ.* මුලකුරු සමග නම :————.

02. *අ.* ලිපිනය :————.

*ආ.* *දුරකථන අංකය* :————.

03. උපන් දිනය -

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

04. 2007 මාර්තු 23 වෙනි දිනට වයස :

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| | | |

05. විවාහක/අවිවාහක බව :

| විවාහක | අවිවාහක |
|---|---|
| | |

06. ස්ත්‍රී පුරුෂ භාවය :

| පුරුෂ | ස්ත්‍රී |
|---|---|
| | |

07. ශ්‍රී ලාංකික පුරවැසි භාවය :

| උපතින් | ලියාපදිංචි වීමෙන් |
|---|---|
| | |

08. අධ්‍යාපන සුදුසුකම් :

*(අ) අ.පොස. (සා.පෙළ) පරීක්ෂණය*

අධ්‍යාපනය ලැබූ

විදුහලේ නම :————.

විභාග අංකය:————.

අවුරුද්ද:————.

*(ආ) අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය*

අධ්‍යාපනය ලැබූ

විදුහලේ නම :————.

විභාග අංකය:————.

අවුරුද්ද :————.

ලබාගත් "**Z**" ලකුණු

සංඛ්‍යාව :————.

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 | ———. | ———. |
| 2 | ———. | ———. |
| 3 | ———. | ———. |
| 4 | ———. | ———. |
| 5 | ———. | ———. |
| 6 | ———. | ———. |
| 7 | ———. | ———. |
| 8 | ———. | ———. |
| 9 | ———. | ———. |

අ.පො.ස. (සා.පෙ.) පරීක්ෂණයේදී ඉංග්‍රීසි භාෂා විෂයයට ඔබ ලබාගත්තේ ඩී/ඒ, සී/බී හෝ එස් සාමාර්ථයක් ද යන්න දක්වන්න. ☐

| | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 | ———. | ———. |
| 2 | ———. | ———. |
| 3 | ———. | ———. |
| 4 | සාමාන්‍ය | ———. |

පොදු පරීක්ෂණයේ ලකුණු

———

විෂය ධාරාව

භෞතික විද්‍යාව ජීව විද්‍යාව වානිජ කලා

විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ඇතැයි විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් සහතික කර තිබේද:

| ඔව් | නැත |
|---|---|
| | |

(කරුණාකර අදාල සහතිකයේ පිටපතක් අමුනා එවන්න)

09. ඔබ නියෝජනය කර ඇති ක්‍රීඩා සලකුණු කරන්න.

| | *පාසල්* | *දිස්ත්‍රික්* | *ක්‍රීඩා සමාජ* | *ජාතික මට්ටම්* |
|---|---|---|---|---|
| 1. මලල ක්‍රීඩා | | | | |
| 2. බැඩ්මින්ටන් | | | | |
| 3. පැසිපන්දු | | | | |
| 4. ක්‍රිකට් | | | | |
| 5. හොකී | | | | |
| 6. රගර් | | | | |
| 7. පාපන්දු | | | | |
| 8. පිහිනුම් | | | | |
| 9. ටේබල් ටෙනිස් | | | | |
| 10. ටෙනිස් | | | | |
| 11. වොලිබෝල් | | | | |
| 12. මල්ලවපොර | | | | |
| 13. කරාටේ | | | | |
| 14. ජූඩෝ | | | | |
| 15. බොක්සින් | | | | |
| 16. ස්කොෂ් | | | | |

10. බාහිර ක්‍රියාකාරකම් :

| | |
|---|---|
| අ. සංගීත කණ්ඩායම | |
| ආ. කැඩෙට් | |
| ඇ. බාලදක්ෂ | |
| ඈ. සමාජ | |
| ඉ. ශිෂ්‍යනායක | |
| ඊ. නිවාස නායක | |
| උ. විදුහලේ නායක | |

11. ශාරීරික මිනුම් ප්‍රමාණය:

| උස | | බර | පපුව (ප්‍රශ්වාස) |
|---|---|---|---|
| අඩි | අඟල් | රාත්තල් | අඟල් |
| | | | |

අදාළ වෙනත් කරුණු :

(අවශ්‍ය නම් කඩදාසියක් ඇමිණිය හැක)

12. ඔබ චරිත සහතික ලබාගත් පුද්ගලයන්ගේ නම් :

| *නම* | *ලිපිනය* | *වෘත්තිය* | *දුරකථන* |
|---|---|---|---|
| i. ............................ | ..................... | ......................... | ................................ |
| ii. ............................ | ..................... | ......................... | ................................ |

13. "සේනාවිධායක, කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය" නමින් "ලංකා බැංකුවේ, මොරටුව - ඉඩම ශාඛාවේ" අංක "681950" ගිණුමට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල් සියයක් (රු. 100) බැර කර පහත සඳහන් විස්තර දක්වන්න. (මුදල් ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත සමඟ අමුණා එවිය යුතුය.)

(i) මුදල් ගෙවූ දිනය :————.

(ii) මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාව :————.

14. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය හා පිළිගැනීම අනුව නිවැරදි හා සත්‍ය බැව් ගෞරවයේ නාමයෙන් ප්‍රකාශ කරමි. මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් දක්වා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බැව් මා තෝරා ගැනීමට පෙරාතුව අනාවරණය වුවහොත් මා තෝරාගැනීම සඳහා නුසුදුස්සෙකු වන බවත් තෝරාගැනීමට පසුව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියකින් තොරව අස්කිරීමට අවකාශ ඇති බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

02-636

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

### අධීක්ෂණ නිලධාරීන් සඳහා කළමනාකරණය පි කෙටිකාලීන පුහුණු පාඨමාලාව

### CERTIFICATE COURSE IN MANAGEMENT FOR SUPERVISORS

1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතෙන් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, අධීක්ෂණ නිලධාරීන් සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලාවක් 2007 පෙබරවාරි මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මෙම පුහුණු පාඨමාලාව සඳහා විශේෂයෙන්ම මුද්‍රණ ආයතනයන්හි අධීක්ෂණ නිලධාරීන්, නියාමකවරුන්, පුහුණුවන කළමනාකරුවන් ඉලක්ක කර ඇත. මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්හි නියුතු අලෙවි හා ගණකාධිකාරී වැනි විෂයන්ට සම්බන්ධ නිලධාරීන්ට ද මුද්‍රණ හා ග්‍රැෆික් ශිල්පය ගැන අවබෝධයක් ලබා ගත හැක.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | සති 16 (පැය 48) (පෙ.ව. 9.00 - 12.00 සෙනසුරාදා දිනයන්හි) |
| පාඨමාලා මාධ්‍යය | - | සිංහල / ඉංග්‍රීසි |
| ඇතුළත්වීමේ අවම සුදුසුකම් | - | මුද්‍රණ හා ග්‍රැෆික්ස් ආයතනයන්හි නියුතු නිලධාරීන් |
| පාඨමාලා ගාස්තුව | - | රු. 7,500 |

පාඨමාලා අන්තර්ගතය -

1. Different Printing Methods and Products
2. Steps in the Offset Production Process
3. Sequence of Print Production
4. Keeping track of work in hand
5. Thinking backward planning
6. Scheduling of work
7. Importance of Keeping Statistics
8. Work Study
9. Standardization of the Plate - Making Process
10. Print Quality Control
11. Litho Press Problems
12. Introductioin to Statistical Process Control
13. Introduction to Costing and Estimating
14. Stock Controlling
15. Waste Management
16. Human Resource Management
17. Quality and Productivity
18. Industrial Relations
19. Management in Practice
20. New Development in Printing Industry

සීමිත සිසුන් ප්‍රමාණයක් බඳවා ගන්නා බැවින් පහත දුරකතන අංකයෙන් අමතා ආසනයක් වෙන්කරවා ගන්න.

*විමසීම් -*

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකතන අංක – 679791, 686162.
ෆැක්ස් – 686162.
ඊමේල් : Sliopdir@sri.lanka.net

02-612

---

## සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2006 (ii)

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල අවශ්‍යතා පදනම් කරගනිමින් බඳවා ගනු ලැබේ.)

01. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) 2005 වර්ෂය දක්වා අ. පො. ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට විද්‍යා විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත්ව තිබීම;

සහ

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබීම;

අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉහත විභාග දෙකෙහි සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

02. අනෙකුත් සුදුසුකම් :-

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය,
(ආ) 2007.03.23 දිනට වයස අවු 18 නොඅඩු වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය,
(ඇ) උස අඩි 04 අඟල් 10 ට නොඅඩු විය යුතුය,
(ඉ) අවිවාහක විය යුතුය,
(ඊ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති වීම හා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය,
(උ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවුරුදු තුනක් පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද දායක ලැයිස්තුවේ සහතික කළ පිටපත් අමුණා එවිය යුතු වේ. අයදුම්කරුවන්ගේ නම ඡන්ද නාම ලේඛණයේ සටහන් වී නොමැති නම් ඔහුගේ/ඇයගේ දෙමාපියන්ගේ නම් ඡන්ද දායක ලැයිස්තුවේ තිබිය යුතුය.

එසේ සඳහන් වන්නේ තම දෙමව්පියන්ගේ නම් බව සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ද අමුණා එවිය යුතු වේ.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන අතර, අ.පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ලැබූ ලකුණුවල කුසලතාවය අනුව දිස්ත්‍රික් පදනමින් අවශ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

03. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මෙම නිවේදනයෙහි අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 8 1/2" x 13 1/2" ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතුවේ.

ආදර්ශ අයදුම්පතේ දක්වා ඇති අංක 01 සිට අංක 09 දක්වා වගන්ති 01 පිටුවේ ද අංක 10 වගන්තිය 2 පිටුවේද අංක 11 සිට අංක 14 දක්වා වගන්ති 3 වන පිටුවේ ද වන පරිදි අයදුම්පත් සකස් කළ යුතුවේ.

(ආ) අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම - 2006 (ii)" යනුවෙන් සඳහන් කොට 2007.03.23 දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, සුවසිරිපාය අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලෙන් නැතිවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව වගකියනු නොලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ/රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 80,160 නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.

(ඇ) අයදුම් පත්‍රයේ සඳහන් මුද්දර කොටුවේ රු. 100 මුද්දර අලවා තම අත්සන යොදා අවලංගු කල යුතුය.

04. පුහුණු කිරීමේ පරිපාටිය :

(අ) තෝරාගත් අයදුම්කරුවන් සිසු හෙද/හෙදියන් වශයෙන් හෙද පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් අවුරුදු 03 ක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත හෙද පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීතිරීති වලට හා කළින් කල පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විනය හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

පුහුණු කාලය තුළදී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා නොපැමිණෙන දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80% ක පැමිණීම අනිවාර්ය වේ.

(ඈ) හෙද විද්‍යාලක පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවනු ලැබේ.

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවසාන විභාගයෙන් සමත්වන අභ්‍යාසලාභීන් II ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ මාණ්ඩලික හෙද තනතුරට අදාළ වැටුප් පරිමාණය මත, තනතුරුවල පුරප්පාඩු ඇති වන පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්වීම් දෙනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත්වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

05. විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම :-

(අ) සියළුම අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍රය එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන තුන් අවුරුදු කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත් එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 10 ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු ය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාල පරිච්ඡේදය කළින් කලට විනිශ්චය කරනු ඇත.

06. සේවයෙහි නියුක්ත කරවීමේ නියමයන් :

(අ) ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත පත් කෙරෙනු ලබන මාණ්ඩලික හෙද තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වේ.

(ආ) II ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ මාණ්ඩලික හෙද තනතුරුවලට පත්කරනු ලබන්නේ අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වය.

07. සේවා කොන්දේසි :

(අ) සියළුම අභ්‍යාසලාභීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වේ.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 6/2006 පරිදි රු. 15,080- 5 x 150 - 9 x 240 -7 x 240 - 20 x 320 - රු. 26,420 වැටුප් පරිමාණය මත හෙද නිලධාරීන් II ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේ තනතුරුවලට පවත්නා පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ.

(ඇ) හෙද සේවයේ සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුව කෙරෙන ස්ථාන මාරුවීම්වලට මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

සිසු හෙද හෙදියන් වශයෙන් පුහුණුව සඳහා
බඳවා ගැනීම් - 2006 (ii)

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්):————.

03. (i) ස්ථිර ලිපිනය : (සිංහලෙන්)
(ii) දිස්ත්‍රික්කය : (ඉංග්‍රීසියෙන්)

04. උපන් දිනය : වර්ෂය :————, මාසය :———— ,දිනය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

අදාළ කොටුවේ ( ✓ ) යොදන්න.

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාළ කොටුවේ (✓) යොදන්න.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. උස : අඩි :————, අඟල් :————.

09. පුහුණුව හැදෑරීමට අපේක්ෂිත මාධ්‍ය :

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |

අදාළ කොටුවේ (✓) යොදන්න.

10. (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (විද්‍යා විෂයය ධාරාව) (ලකුණු සටහන් පිටපත් ද අමුණන්න)

(1) වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(ආ) අ. පො. ස. (සා.පෙළ) විභාගය :

*පළමු වාරය :*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6 | | | 12. | | |

*දෙවැනි වාරය :*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6 | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද?

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

ඔව් නම් විස්තර සපයන්න. :————.

12. ඔබ සිසු හෙද පුහුණුවට තෝරා ගනු ලැබුවහොත් පුහුණුව ලැබීමට කැමැති හෙද විදුහල් ඔබගේ කැමැත්තේ අනු පිළිවෙල පහත සඳහන් ලැයිස්තුවෙහි සඳහන් කරන්න. (මනාපය පිළිවෙලට 1, 2 ආදී වශයෙන් සඳහන් කරන්න.)

| | |
|---|---|
| කොළඹ හෙද විදුහල | |
| මහනුවර හෙද විදුහල | |
| යාපනය හෙද විදුහල | |
| කඳාන හෙද විදුහල | |
| අනුරාධපුර හෙද විදුහල | |
| ගාල්ල හෙද විදුහල | |
| කුරුණෑගල හෙද විදුහල | |
| බදුල්ල හෙද විදුහල | |
| රත්නපුර හෙද විදුහල | |
| මඩකලපුව හෙද විදුහල | |
| ශ්‍රී ජයවර්ධනපුර හෙද විදුහල | |
| අම්පාර හෙද විදුහල | |

13. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

| |
|---|
| රු. 100ක වටිනාකමක් සහිත මුද්දර අලවා අත්සන යොදා අවලංගු කල යුතුය. |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................... මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2007 .................................................. වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ,

සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

02-670

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.